# තුන් සිත් ගී සමගින් ඇන්ජලින් රෝහණ සහ චන්ද්‍රසේන




මා එදා දෑසින් සනහා
ඔබ දුන් කැල්මන් සිත රැඳුනා
අද එනවයි ඔබ දිවුරා කීවා ........

කලකට පසුව ගීත කොකිලාවී ඇන්ජලින් ගුණතිලක තවත් සහුරද්‍ය ගායකයන් දේපලක් වන චන්ද්‍රසේන හෙට්ටි ආරච්චී සහ රෝහණ බෝගොඩත් සමග මෙල්බන් නුවර තුන් සිත් ගී නමින් ප්‍රසංගයක් පවත්වන්න සූදානම් වන බව සන්නසට දැන ගන්නට ලැබෙනවා .සන්නස පාඨකයින් වෙනුවෙන් ප්‍රසංගය පිළිබඳව තොරතුරු ලබාදුන් ඇන්ජලින් ගුණතිලක සහ චන්ද්‍රසේන හෙට්ටිආරච්චි මෙම සංචාරය පිළිබඳව තොරතුරු කීවේ මෙන්න මේ ආකාරයටයි.

මෙම ප්‍රසංගය මෙල්බන් වාසීන්ට කලකට පසුව ලැබෙන වෙනස්ම අත්දැකීමක් වනවාට නොඅනුමානයි .මෙහෙම කියන්නේ ඇන්ජලින් .

මගේ මතකයේ හැටියට මම ඔස්ට්‍රලියාවේ ප්‍රසංගයක් පවත්වන්නේ වසර පහකට හෝ ඊට මදක් වැඩිකලකට පසුවයි .මම සාමාන්‍යයෙන් ලැබෙන හැම ප්‍රසංගයටම සහභාගිවන ගායිකාවක් නොවෙයි. මම තෝරාගත් මට සහ මගේ රසිකයින්ට සදාරණයක් ඉටුවෙයි කියල හිතෙන ප්‍රසංග වලට පමණයි සහභාගිවන්නේ. නිරෝෂන් පුතාගේ ආරාධනය සහ ප්‍රසංගයේ අනෙක් සංවිධාන කටයුතුත් සමගම මට හැගුනා නිරෝෂන්ට ප්‍රසංග කලාවේ වෙනසක් කරන්න උවමනාවක් සමගම හැකියාවකුත් තියෙනවා කියලා. ඔන්න ඔය කියන කරුණු කාරණාත් සමග තමයි මම මේ ප්‍රසංගයට සහභාගීවන්නේ .මම මෙහිදී මාගේ ජනප්‍රිය ගීත මගේ රසික අසන්නන් වෙනුවෙන් ගායනාකිරීමට බලාපොරොත්තු වෙනවා. ප්‍රථම වතාවට තමයි මම රෝහණ සහ චන්ද්‍රසේන සමග ප්‍රසංගයක් කරන්නේ .රෝහණ සහ චන්ද්‍රසේන කියන්නේ සංගීත ක්ශේත්‍රයේ බොහෝ අත්දැකීම් බහුල දෙපලක්. අපි තුන් දෙනා වෙනස්ම ආකාර තුනකට තමයි ගීත ගායනා කරන්නේ .ඉතින් එක හොඳ සංකලනයක් සේම හොඳ විවිධත්වයක් ප්‍රසංගය තුල ඇති කරයි කියල මම බලාපොරොත්තු වෙනවා . අනෙක් අතට රටින් පිට අපේ රසිකයින්ට එකම වේදිකාවකදී අපි තිදෙනාවම දකින්න ලැබීමත් භාග්‍යයක් වෙයි.

**සිතුම් පැතුම් සඳ ආදරේ උදා වේදෝ ...**
**මහදේ සොඳුරු අහසේ අනාගතේ ....**

ඇන්ජලින් ගුණතිල කියන්නේ ගුවන් විදුලියේ තවත් අසම සම සොයාගැනීමක්. කොහොමද මේක සිදුවුනේ.?

මට වයස අටේදී තමයි අපි මුලින්ම කොළඹ පදිංචියට එන්නේ .මගේ අක්ක රෝස් තමයි මගේ මුල්ම හැකියාවන් දැකල ගායිකාවක් වෙන්න අනුබල දීල තියෙන්නේ. වයස නමයේදී මගේ දෙමව්පියන් මාව යොමුකලා සුනිල් ශාන්ත මාස්ටර් ගාවට සංගීතය ඉගන ගැනීම සඳහා .ගුවන් විදුලියේ කරුණාරත්න අබේසේකරයන්ගේ ළමා පිටියේ ගායිකාවක් විදිහට තමයි මම මුලින්ම සංගීත ක්ශේත්‍රයට එකතු වන්නේ .ඒ ඇන්ජලින් .ඩී .ලනරෝල් නමින් .පසුව ළමාපිටියෙන් චිත්‍රපටි ගීත ගායනට පිවිසීමත් සමග තමයි මම ඇන්ජලින් ගුණතිලක විදිහට ප්‍රසිද්ධියට පත් වන්නේ . එදා මෙදා තුර මා විසින් සරල ගී ,චිත්‍රපට ගී ,ටෙලිනාට්‍ය ගී ,ගුවන් විදුලි ගී ,වැනි නොයෙක් මාදිලියේ ගීත ගණනාවක්ම ගායනා කරලා තිබෙනවා . ප්‍රමාණයක් වශයෙන් කියන්න මටවත් හරියට මතකයක් නෑ .සිංහල චිත්‍රපටයේ සහ චිත්‍රපට ගීතයේ ජෝතිමත්ම යුගය තමයි ජෝති ඇන්ජී යුගය .එක එදාට සේම අදටත් වලංගුයි .

අදනම් ඉතින් අපේ ගීත බොහෝ ඇහෙනවා අඩුයි . ඒ අතරිනුත් අපේ අලුත් නිර්මාණ ඇහෙනවා

**චානක ඉලංගගේ 365 දින ගී මුළුව**

ඉතාම අඩුයි .එහෙමයි කියල අපි නිර්මාණ කරන එකේ අඩුවක් නම් නෑ .අනික සල්ලි දීල මගේ සින්දු විකාශනය කරගන්නනම් මට කිසිම උවමනාවක් නෑ .අද ඉතින් සිදුවෙන්නේ ඒවගේ දේවල්නේ .එහෙම නැත්නම් නිවෙදකයින්ට සන්තෝෂම් දෙන්න .අපේ ගීත මේ අලූත් රේඩියෝ චැනල් වලින් විකාශනය උනේ නැහැ කියල අපේ රසිකයින් අපිව අමතක කරලා නෑ .මම කියපු ගීත කැසට්පට් වලින් නැත්නම් සීඩී තැටිවලින් එහෙමත් නැත්නම් අන්තර්ජාලය හරහා ඒගොල්ලෝ අහනවා . එහෙමත් නැතිනම් මෙවැනි ප්‍රසංග හරහා රසිකයෝ අපිත් සමග අපේ ගීත සමග එකතු වෙනවා .අනික මුළු ලෝකෙම දන්නවා ඇන්ජලින් තමයි ලංකාවේ සිනමා ගීත ගැයුවේ කියල .මට හැගෙන විදිහට ගායනය කියන්නේ මට දෙවියන් වහන්සේගෙන් ලැබුන තෑග්ගක් .

මගේ සියලූම රසික රසිකාවියන්ට මම අරාධනා කරනවා ඔබ ඉන්නේ ඔස්ට්‍රලියාවේ මෙල්බන් නුවර නම් එන්න මැයි 28 සවස 6.30 ට ජෝර්ජ් වූඩ් රංග ශාලාවට .තුන් සිත් ගී සමගින් අපි එදාට හමුවෙමු .

## ප්‍රවීණ ගායන ශිල්පී චන්ද්‍රසේන හෙට්ටිආරච්චි දැක්වුයේ මෙවැනි අදහසකි .

**අම්මා ජීවන උයන් තෙරේ**
**නොනිමී දැල්වෙන පහනකි නිරන්තරේ**
**ඔබ මට සුවය ගෙනේ ......**

මම ප්‍රසංගයක් සඳහා ඕස්ට්‍රලියාවට පැමිණෙන්නේ වසර හතකට පමණ පසුවයි. කොහොමටත් මෙල්බන් වාසී ලාංකිකයින් රටින් දුරක හිටියත් නිරතුරුවම කලා කටයුතු සමගින් අපිත් සමග සමීප සම්බන්දතවාක් පවත්වනවා .මම දන්නා විදිහට ලංකාවෙන් පිටත අපේ ගායක ගායිකාවන් වැඩිම ප්‍රසංග ගනනක් පවත්වා තිබෙන්නේ මෙල්බන් නුවරයි . උසස් රසවින්දනයක් සහිත පිරිසක් මෙල්බන් හී වෙසෙන නිසා තමයි අපිට මෙවැනි කලා කටයුතු නිරතුරුවන මෙල්බන් නගරයේ සංවිධානය කිරීමට හැකියාව ලැබී තිබෙන්නේ . තවත් දෙයක් තමයි රටින් පිට බොහෝ කලා කරුවන් පිරිසක් වෙසෙන්නෙත් මේ වෙනකොට මෙල්බන් නුවරයි . මම දන්නා විදිහට ඔස්ට්‍රලියාවේ කලා කේන්ද්‍රය තමයි මෙල්බන් . තුන් සිත් ගී ප්‍රසංගය තුල මගේ පැරණි සහ අලූත් ජනප්‍රිය ගීත බොහොමයක් මෙල්බන් රසික රසිකාවියන්ට අසන්න ලැබේවී .

චන්ද්‍රසේන හෙට්ටිආරච්චි කියන්නේ තරුණ සේවා සභාවේ සොයාගැනීමක් . අද ඔබ එහි සංගීත උපදේශක වරයෙක් .කොහොමද ඔබ තරුණ සේවා සභාව සමග එකතුවෙන්නේ .?

**යෙහෙළියක සේ සොයුරියක සේ**
**ඔබ කියන අයුරින්**
**මා කෙසේ ඔබ දෙස බලන්නද**
**පෙම් කඳුළු දෑසින් .......**

යටියන්තොට ගරාගොඩ සිංහල කනිෂ්ඨ විද්‍යාලයෙන් සංගීතයට අත්පොත් තබපු මට සංගීතය පිළිබඳව මුලින්ම හැගීමක් ලබා දෙන්නේ මගේ ආදර□ය දෙමව්පියෝ දෙන්නයි .ඔවුන් දේපළ තමයි ඔවුන් දන්නා විදිහට මට මුලින්ම ගීත ගයනා කරන්න ඉගැන්නුවේ .මගේ අම්මයි තාත්තයි දෙන්න ඉස්සර අපිට ඇහෙන්න ගීත ගායනා කරනවා .ඔන්න ඔය විදිහට තමයි මගේ ගමන ආරම්භ වන්නේ .

1979 යෞවන සම්මාන උළෙලේ තිබුන තරගයකට ඒකළ ගායනයක් ඉදිරිපත් කරමින් තමයි මම ගායකයෙකු විදිහට කල එළි බසින්නේ .එදා මම ඉදිරිපත් කල ගීතයේ පදරචනය සංගීතය සහ ගායනය යන තුනම මගේ උනා විතරක් නොවෙයි ඒ තුනටම මට යෞවන සම්මාන තුනක් ලැබුන .ඒ ලැබුන උත්තෙජනයත් එක්කම මට ජාතික තරුණසේවා සභාවේ බෙල්වූඩ් රූපවාහි□ ගම්මානයේ සංගීතය පිළිබඳව ඩිප්ලෝමාවක් හදාරන්න අවස්ථාවක් ලැබෙනවා .

ඔය කාලයේදීම මට හොඳ ගීත කීපයක්ම ලැබෙනවා . මගේ ගුරුවරයා ප්‍රවීණ ගායන ශිල්පී ෂර්ලි වෛජ්‍යන්ත මහතා මට හොඳ ගීතනු නිර්මාණය කරලා දුන්නා .ඒ වගේම නිහාල් ගම්හේවා මහතාත් මට ගීත නිර්මාණය කළා . ඊට අමතරව රෝහණ වීරසිංහ අජන්තා වීරසිංහ වැනි ප්‍රවීණයින් මට පද රචනාවලින් උදවු කළා . තරුණ සේවා සභාව කියන්නේ ලංකාවේ ජනප්‍රිය ගායක ගායිකාවන් බොහෝ පිරිසකට ක්ශෙත්‍රයේ දොර විවර කරලා දුන්නු ආයතනයක් .

වර්තමාන සංගීත රටාව පිළිබඳව ඔබ දරන්නේ කෙබඳු ආකල්පයක්ද .? සංගීත ගුරුවරයෙකු විදිහට

මේ ලෝකේ හැමදෙයම වෙනස් වනවා .සංගීතයත් වෙනස් වෙනවා .වෙනස්වෙවී තමයි ඔය අද තියෙන තත්වයට ඇවිත් තියෙන්නේ .මුලින්ම අපිට තිබුනේ ජනගී පසුව එනවා ඉන්දීය ආභාෂයක් සහිත ගී .පසුව එනවා කොපි ගී . මේක අපි වෙනස්කරනවා 1980 දී අපේම සිංහල අනන්‍යතාවක් සහිත ගීත නිර්මාණය කරමින් .අද තියෙන්නේ ජාත්‍යන්තරය සමග බැඳුන ගීත සහ සංගීත රටාවක් .සමහර විට තව ටික කලකින මේවත් වෙනස්වෙලා වෙන රටාවක් මතුවෙයි .නමුත් තියෙන ගැටලූව ඇවිල්ල ඔය කොයි කොයි රටාවන් ආවත් පැවැත්මක් තියෙන්නේ කුමන ගීතවලටද කියන එකටයි .රසිකයා වැළඳ ගන්නේ ඔවුන්ට දැනෙන ඔවුන්ට රසවිඳිය හැකි ගීත පමණයි .කවුරු මොනදේ ප්‍රචාරය කලත් මොන විදිහේ අලූත් නිෂ්පාදන කලත් අවසානයේ රසිකයින් අතරට යන ගීත ටික විතරක් ඉතුරු වෙවී .මම 80 දසකයේ ගායනා කරපු ගීත අදත් ප්‍රසංග වේදිකාවේ ගායනා කරනවා වසර විසි පහ හෝ තිහ පැරණි ගීත . අතීතයේදී සිදු උනෙත් එකයි .ඉදිරියටත් එහෙමයි .අපි ඒ නිසා ඒගැන කලබල වෙන්න වෙන්න ඕන නෑ . රසිකයා තමයි අවසානයේ තීරණය කරන්නේ පවතින්නේ කුමක්ද විසිකරන්නේ කුමක්ද කියන එක .

**මගේ සියලූම රසික රසිකාවියන්ට මම කැමති අරාධනා කරන්න ඔබ ඉන්නේ මෙල්බන් නුවරනම් එන්න නරබන්න තුන් සිත් ගී ප්‍රසංගය මැයි 28 සවස 6.30 ට ජෝර්ජ් වූඩ් රංග ශාලාවේදී .**




වෙසක් පුර පසලොස්වක පොහොය නිමිත්තෙන්
මැයි මස 20 ,21 සහ 22 දිනයන්හි
විශේෂ ආගමික වැඩසටහන්
ඩැන්ඩිනොන් ධම්ම දීප භාවනා මධ්‍යස්ථානයේදී පැවැත්වේ.

# මැයි 20 වෙනි සිකුරාදා පෙ.ව 8.30 සිට ප.ව 5.00 දක්වා විශේෂ භාවනා වැඩසටහනක් පැවැත්වේ.
# මැයි මස 21 වෙනි සෙනසුරාදා පෙ .ව 8.30 සිට ප.ව 5.00 දක්වා
ගිරපායස පුජා ,ධර්ම සාකච්ජා, ධර්ම දේශනා ,භාවනා වැඩසටහන් පැවැත්වෙන අතර සවස විශේෂ ගිලන් පස ,මල් පහන් පුජාවක් පැවැත්වේ.
# මැයි මස 21 වෙනි දින රාත්‍රි ආහාර දන්සල ප.ව 6.00 සිට පැවැත්වේ.

# මැයි මස 21 වෙනි සෙනසුරාදා පෙව 8.30 සිට 5.00 දක්වා
ධර්ම සාකච්ජා , ධර්ම දේශනා, භාවනා වැඩසටහන් පැවැත්වෙන අතර සවස විශේෂ ගිලන් පස මල් පහන් පුජාවක් පැකෙනම් භාවනා මධ්‍යස්ථානයේදි පැවැත්වේ.

# මැයි මස 22 වෙනි ඉරුදින ධම්ම දීප දහම් පාසලේ දුදරුවන්ගේ ශීල සමාදානය පැවැත්වේ.
# මැයි මස 20,21,22 යන දිනවල ධම්ම දීප දහම් පාසලේ දුදරුවන්ගේ චිත්‍ර ප්‍රදර්ශනයක් ද පැවැත්වේ.

වැඩි විස්තර සදහා විහාරස්ථානය අමතන්න – 9794 9492